දිනමිණ The Dinamina

dinamina.lk @dinaminanews

# විද්‍යා

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නිල පුවත්පත




# උචිත තාක්ෂණය දියුණු කිරීම හා බුද්ධිමය දේපළ හුවමාරුවට කොරියානු රජයෙන් ව්‍යාපෘතියක්

- දුලිප් නයනප්‍රිය -

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන්, කොරියානු රජයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ උචිත තාක්ෂණය දියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතියකට කටයුතු සංවිධානය කර තිබේ. මේ ව්‍යාපෘතියේ මූලික අදියරේ දී කොරියානු බුද්ධිමය දේපළ නියෝජිතායතනයේ (KIPA)සහ කොරියානු නවෝත්පාදන ප්‍රවර්ධන සංගමයේ (KIPO) තාක්ෂණික සහ මූල්‍යාමය සහයෝගය මත නිර්මාණය කරන ලද පොල් කුඩුවලින් පොල් තෙල් නිස්සාරණය කිරීමේ යන්ත්‍ර 03ක් සහ උචිත තාක්ෂණ සංවර්ධන මධ්‍යස්ථානයක් මෙරට ස්ථාපිත කිරීම පසුගිය දා කුලියාපිටිය බටහිර විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයේ දී විද්‍යා , තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශ ලේකම් උදය සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

ප්‍රදානය කළ යන්ත්‍ර 3 න් පළමු යන්ත්‍රය කුලියාපිටිය බටහිර විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයේත්, එක් යන්ත්‍රයක් නැගෙනහිර කුලියාපිටිය විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයේත් ස්ථාපිත කරන ලද අතර, අනෙක් යන්ත්‍රය පොල් තෙල් ආශ්‍රිත පර්යේෂණ කටයුතු වෙනුවෙන් කාර්මික තාක්ෂණ ආයතනයේ ස්ථාපිත කරන ලදී.

එම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC), කාර්මික තාක්ෂණ ආයතනය(ITI), විද්‍යාතා වැඩසටහන ආදී ශ්‍රී ලාංකික ආයතන සහ සංවිධාන ගණනාවක සහයෝගයෙන් ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

invent Sri Lanka 2018

# ඉතිහාසයේ ප්‍රථම වතාවට ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකාවේ දී

ඉතිහාසයේ ප්‍රථම වතාවට ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශනයක් මෙරට දී පැවැත්වීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකියාව ලැබී ඇත. ඒ අනුව මේ ප්‍රදර්ශනය 2018 ඔක්තෝබර් මස 24 හා 25 යන දෙදින කොළඹ නෙළුම් පොකුණ පරිශ්‍රයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

ප්‍රදර්ශනය පැවැත්වීමේ මූලික අරමුණ ජාත්‍යන්තර තරඟ සඳහා මුහුණ දීම වෙනුවෙන් විදෙස් ගතවීමට වරම් නොලබන ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් හා එම ප්‍රදර්ශන නැරඹීමේ අත්දැකීම විඳගැනීමට බලාපොරොත්තු සහගතව සිටින එහෙත් අවස්ථාවක් නොලබන ශ්‍රී ලාංකිකයන් යන දෙපාර්ශ්වයේම අපේක්ෂාවන් එකම අවස්ථාවක දී යථාර්ථයක් බවට පත් කරලීමයි.

NATIONAL SCIENCE FOUNDATION

# පර්යේෂණ කළමනාකරණ වැඩමුළුවක්

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික විද්‍යා පදනම මගින් ගෝලීය පර්යේෂණ සභාවේ සහයෝගය ඇතිව සංවිධාන කළ පර්යේෂණ කළමනාකරණය පිළිබඳ වැඩමුළුවක් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ඇමැති සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ දී ආරම්භ විය.

මේ වැඩමුළුවට ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පර්යේෂණ ආයතන රැසක් හා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල නියෝජනය කරමින් විද්‍යාඥයන් හා පර්යේෂකයන් රැසක් සහභාගී වූහ.




# ශ්‍රී ලාංකීය යොවුන් නව නිපැයුම්කරුවන්ගෙන් විශිෂ්ට දස්කම්




ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිසම මගින් සංවිධානය කරන ලද " සහසක් නිමැවුම් – 2017" ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනයේ දී පාසල් අංශයෙන් ජයග්‍රහණය කළ නව නිපැයුම් 13ක් ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිසමේ පූර්ණ අනුග්‍රහය සහ මඟපෙන්වීම යටතේ, දෙසැම්බර් 8 සිට 10 දක්වා තායිවානයේ දී පැවති Kaohsiung International Invention and Design EXPO (KIDE) – 2017 ප්‍රදර්ශනයට ඉදිරිපත් කරන ලදී. නව නිපැයුම් සඳහා වූ ලොව ප්‍රමුඛතම ආයතනයක් වන ලෝක නව නිපැයුම් බුද්ධිමය දේපළ සංවිධානය (WIIPA) විසින් KIDE – 2017 ප්‍රදර්ශනය සංවිධානය කරන ලද අතර ඒ සඳහා රටවල් 26ක් නියෝජනය කරමින් නව නිපැයුම්කරුවන් 399ක් සහභාගී වූහ.

ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලාංකීය යොවුන් නව නිපැයුම්කරුවන්ගේ විශිෂ්ට දක්ෂතා විශේෂ ඇගයීමට ලක්වූ අතර "KIDE – 2017" "හොඳම අන්තර්ජාතික යොවුන් නව නිපැයුම්කරු" සඳහා වන සම්මානය දිනා ගැනීමට,"ජීව අඟුරු සහ ප්ලාස්ටික් මිශ්‍රණය" කළ ජේ. එම්. ලහිරු කාවින්ද සහ ජේ. එම්. අයේෂා දේවින්දි මෙහිදී සමත් විය.

# සිරිලක් නාමය බැබළ වූ ජාත්‍යන්තර ජයග්‍රහණ




ජයග්‍රහණයේ අරමුණු පෙරදැරිව 2018 වසරට පියනගන්නට සැරසෙද්දී, 2017 වර්ෂය අවසන් වන්නේ ද ලක් මවට මෙන්ම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට සේම ඒ හා ඒකාත්මික වූ නව නිපැයුම්කරුවනට ද තවත් සුවිශේෂී වසරක් ලෙස අභිමානයක් එක් කරමිනි. දේශීය නව නිපැයුම් සඳහා ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද 2017 වසරේ දී සුවිශේෂී ජයග්‍රහණ රැසක් හිමි වීම ඊට ප්‍රධානතම හේතුවයි.

**කොමිසමේ අනුග්‍රහය**

මෙහිදී තරගවලට සහභාගී වූ සෑම නව නිපැයුම්කරුවෙක් සඳහාම පූර්ණ අනුග්‍රහය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙතින් ලබාදුන් අතර, එය තරගකරුවන් දිරිගැන්වීමට මෙන්ම විශාල ශක්තියක් ද ගෙන දුණි. 'සහසක් නිමැවුම් 2017' ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය හා තරගයේ විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රථම ස්ථාන හිමි කරගත් යොවුන් නව නිපැයුම්කරුවන් හට පසුගියද තායිවානයේ පැවැති Kaohsiung International Invention and Desighn Expo (KIDE) 2017 නව නිපැයුම් තරගාවලිය නියෝජනය කිරීමේ අවස්ථාව කොමිසම මගින් හිමි කර දුන් අතර, එහිදී රන් පදක්කම් 05ක්, රිදී පදක්කම් 6ක් හා ලෝකඩ පදක්කම් 02ක් දිනාගනිමින් ශ්‍රී ලංකා මාතාවට කීර්තියක් ගෙන දීමට ඔවුන් සමත් වී තිබේ.

**ජයග්‍රහණ**

ජේ. එම්. ළහිරු කාවින්ද හා අයේෂා දේවින්දි යුගලය විසින් නිර්මාණය කළ ගෘහ භාණ්ඩ නිෂ්පාදනයට ජීව අගුරු මිශ්‍රණයක් භාවිත කිරීමේ නව නිපැයුමට රන් පදක්කමක් හා හොඳම ජාත්‍යන්තර නව නිපැයුම්කරු සම්මානය හිමි වූ අතර, ශාක විෂ , සත්ත්ව විෂ හා ශාක හඳුනාගැනීමේ නාමකරණ පද්ධතිය සඳහා රන් පදක්කමක් හිමි විය. ඔවුන්ගේ ම නිපැයුම් වන මාර්ග හා පරිසර නීති ක්‍රියාත්මක කිරීමට උපකාරී වන බහුකාර්ය තත්ත්ව පරීක්ෂණ උපකරණය, නායයෑම් වළක්වන ජීව ඉන්ධන අමුද්‍රව්‍ය සපයන ජීව වැට යන නව නිපැයුම් සඳහා රිදී පදක්කම් ද, සෞඛ්‍ය අවධානම් පෙර දැනුම් දීමේ පද්ධතිය සඳහා ලෝකඩ පදක්කම ද හිමි විය. විජේකුමාර් කේශන් කුමාර් හා විජේකුමාර් විජිත්කුමාර් දෙදෙනාගේ නිපැයුම වන කැමරා සවි කරන ලද අඹ කඩන උපකරණය සඳහා රන් පදක්කමක් හා ක්‍රොඒෂියානු විශේෂ සම්මානයක් හිමිවිය. තිවින්යා රවින්ද්‍රි ප්‍රේමරත්න නිර්මාණය කළ හයිබ්‍රිඩ් ගෑස් කුකරය සඳහා රන් පදක්කම හා මැකාඕ විශේෂ සම්මානය ද එල්. ඊ. කේ. එම්. රත්නවීර ගේ නව නිපැයුම වන ද්වීකාර්ය දෙර අගුල වෙනුවෙන් ද රන් පදක්කමක් හිමිවිය. සඳළු රංසික සෙනෙවිරත්න නිපද වූ මෝටර් බයිසිකල් සඳහා ස්වයංක්‍රීය පැති ආධාරකය සඳහා රිදී පදක්කමක් හා ඉන්දුනීසියානු විශේෂ සම්මානය හිමි විය. කාවින්දි හිරුණි අධිකාරි හා කේ. ජී. සචින්තා සරින්දි යුගලය විසින් නිපදවන ලද ගංවතුර දෙර ආවරණය සඳහා ද , ජේ. ඩබ්. තිමිත් නවෝද්‍ය ගේ නව නිපැයුම වන රෝල්ස් සාදන යන්ත්‍රය ද ඩී. එම්. ඒ. සඳමාල් දිසානායක හා ලක්මාල් වික්‍රමසිංහගේ බස් රථ පා පුවරු ආරක්ෂකය ද වෙනුවෙන් රිදී පදක්කම් ද හිමි විය. එමෙන්ම වී. විශාන්තන් ගේ නිපැයුම වන සනීපාරක්ෂිත මුත්‍ර බැහැර කරලීමේ සරල උපකරණ සඳහා ලෝකඩ පදක්කමක් හිමි විය.











**සුවිශේෂී සන්ධිස්ථානයක්**

මේ තරගාවලියේ තවත් සුවිශේෂී සංධිස්ථානයක් වන්නේ ලෝක නව නිපැයුම් පිළිබඳ බුද්ධිමය දේපළ ආයතන (World Invention Intellectual Prpoerty Associations - WIIPA) මගින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස් ආචාර්ය සී. මහේෂ් එදිරිසිංහ මහතා තරගාවලියේ සෙසු රටවල නව නිපැයුම් අධීක්ෂණය සඳහා ජාත්‍යන්තර ජූරි සභිකයකු ලෙස කටයුතු කිරීමට දෙවැනි වතාවට ද තෝරා ගැනීමයි. 2017 අගෝස්තු මස 4 සිට 6 දක්වා ජපානයේ පැවැති Japan Desighn & Invention Expo (JDIE) 2017 තරගාවලියේ ජාත්‍යන්තර ජූරි සභිකයකු වශයෙන් කටයුතු කිරීමට කොමසාරිස්තුමන් හට විශේෂ ඇරයුමක් ලැබුණි. එපමණක් නොව එම අවස්ථාවන් හිමි වීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ එතුමන් සතු පර්යේෂණ ශක්‍යතාව හා නව නිපැයුම් පිළිබඳව ඇති පරිණතභාවයයි. එය නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වශයෙන් පමණක් නොව රටක් ලෙස ශ්‍රී ලංකාව අගයනු ලැබූ විශිෂ්ට අවස්ථාවකි. ඉහත තරගාවලියට සහභාගී කර වූ ඩී. එම්. සී. දිසානායක මහතා නිපද වූ උවදුරු ආරක්ෂණ පද්ධතිය වෙනුවෙන් රිදී පදක්කමක් ද මෙහිදී හිමි විය.






**45 වැනි ජිනීවා ජාත්‍යන්තර නව නිපැයුම් තරගාවලිය**

මෙහිදී රන් සම්මාන සමග ජූරියේ විශේෂ ඇගැයීම හිමි කර ගැනීමට වෛද්‍ය එම්. පී. එම්. තිලංක රත්නපාල නිර්මාණය කළ "ලැපරස්කොපි ගැට දැමීමේ මෙවලම" හා වෛද්‍ය ආර්. එම්. එම්. අනුප ඉන්දික හේරත් ගේ නිමවුම වන "වීඩියෝ ලැරින්ගොස්කෝපය" සමත් විය. එමෙන්ම ආසිරි දිල්හාන් ද සිල්වා මහතාගේ නව නිපැයුම වන "කෘමි විකර්ශක – පරිසර හිතකාමී මේස රඳවනය" සඳහා රන් සම්මානය හිමි විය. නලින් දර්ශන කරුණාසිංහ මහතාගේ "ඊ ප්‍රෝ1000" නිමැවුම හා එම්. ඒ. ප්‍රින්ස් චන්ද්‍රසේන මහතාගේ "දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා භාවිත කළ හැකි පරිගණක යතුර" නිමැවුම සඳහා රිදී පදක්කම ද එම්. ඒ. ඩස්මන් මහතාගේ "දෙමුහුම් විද්‍යුත් චලන පරීක්ෂකය" හා ඩී. අරුණ ද සිල්වා මහතාගේ " එළවළු ආරක්ෂිත යන්ත්‍රය" වෙනුවෙන් ලෝකඩ පදක්කම් ද හිමි විය.

**මලයාසියානු නව නිපැයුම් තරගාවලිය**

මලයාසියානු නව නිපැයුම් තරගාවලිය 2017 (THE 28TH INTERNATIONAL INVENTION, INNOVATION AND TECHNOLOGY EXHIBITION ITEX 2017) මැයි මාසයේ දී මලයාසියාවේ ක්වාලම්පූර්හි දී පැවැත්විණි. එච්. එම්. ටී. දිල්ශාන් කුමාර හේරත් විසින් නිපදවූ "ආලෝක සැරයටිය" කණිෂ්ඨ අංශයේ හොඳම නිපැයුමට හිමි සම්මානය හා ලෝක තරුණ නව නිපැයුම් සංගමය විසින් පිරිනමන රන් පදක්කම හිමි වූ අතර එස්. කජනන් ගේ "පස හා යකඩ වෙන් කරන චුම්භක" නිපැයුම සඳහා රිදී පදක්කමක් හා ලෝක නව නිපැයුම් බුද්ධිමය දේපළ ආයතන වෙතින් විශේෂ සම්මානයක් හිමිවිය. කේ. තනුජාන් හා එම්. අභිෂේක් විසින් නිපදවූ "ආවර්තිතා වගුව සඳහා ඉගැන්වුම් ආධාරකය" වෙනුවෙන් රිදී පදක්කමක් හිමිවිය.

**කොරියානු නව නිපැයුම් තරගාවලිය**

යොවුන් නව නිපැයුම්කරුවන් ඉලක්ක කරමින් පවත්වන ලද 'ඉනෝවා මයින්ඩ්ස් 2017' රූපවාහිනි නව නිපැයුම් තරගාවලියේ මූලික වටයට සුදුසුකම් ලද තරගකරුවන් අගෝස්තු මස 11 සිට 13 දක්වා දකුණු කොරියාවේ පැවැති korea international youth olympiad (KIYO 2017) කණ්ඩායම් තරගය සඳහා සහභාගී විය. එහිදී රන් පදක්කමක්, රිදී පදක්කමක්, හොඳම නව නිපැයුම සඳහා වන FIRI සම්මානය මෙන්ම ලෝක නව නිපැයුම් හා ව්‍යවසායකත්ව ආයතනය මගින් පිරිනැමෙන විශේෂ සම්මාන ත්‍රිත්වයක් හිමිකර ගැනීමට සමත් විය.

ඉතිරිය ලබන කලාපයට...










# විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය වෙනුවෙන්
# කෙටි කලක දී ඉටුකළ සුවිසල් මෙහෙවර ඇගයේ





දෙදහස් පහළොව වසරේ සිට විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා ලෙස වසර දෙකක පමණ ඉතා කෙටි කලක් තුළ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් දේශීය මෙන්ම අන්තර්ජාතික සම්බන්ධතා ගොඩනගමින්, ලෝකයේ විවිධ විද්‍යා හා තාක්ෂණ ආයතන සම්බන්ධ කරමින් ද ලොව පුරා විසිරී සිටින අප විද්‍යාඥයන් මෙරටට නැඹුරු කරමින් ද, විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ ප්‍රවර්ධනයට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීමට නායකත්වය සපයමින් ද, නව දැක්මකින් යුත් සංවර්ධන ව්‍යාපෘති ඇති කරමින් ද විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට කළ මෙහෙවර උදෙසා කාර්මික තාක්ෂණ ආයතනයේ විද්‍යාඥයන් විසින්

**සුසිල් ප්‍රේමජයන්ත මහතාට ස්තුති පූර්වකව පුදන උපහාරය යි.**

















# නව නිපැයුම් වාණිජකරණ ප්‍රවේශය අප ලද විශාල ජයග්‍රහණයක්


**ආචාර්ය මහේෂ් එදිරිසිංහ**

**කොමසාරිස් - ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම**


***නව නිපැයුම් පුළුල් දක්මක් සහිතව දේශීය ආර්ථිකය හා සම්බන්ධ කරවන විශ්වාසනීය ගමන් මගෙහි ශක්තිමත් සලකුණක් බවට පත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස් ආචාර්ය මහේෂ් එදිරිසිංහ මහතා සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවකි.***

● **නව නිපැයුම්කරුවන් හට සිය නිෂ්පාදන වෙළෙඳපොළ ප්‍රවේශය ජය ගැනීමට අවස්ථාව උදාකරදීම කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා ද?**

1979 වසරේ අංක 53 මගින් බලාත්මක කරන ලද පනතින් බිහි වූ මේ ආයතනය තුළ අපට ඉටුකර ගැනීමට නොහැකිව තිබූ අරමුණු 12ක් අතරින් ප්‍රධානතම එක් අරමුණක් තිබුණා. ඒ තමයි නව නිපැයුම් සඳහා ම වෙන් වූ පර්යේෂණ මධ්‍යස්ථානයක් ඇති කිරීම. තමන්ගේ නව නිපැයුම් වෙළෙඳපොළට ගෙන යන විට මේ අතර පවතින හිඩැස පිරවීමේ ක්‍රියාවලිය ඉටු කරන මධ්‍යස්ථානය, එසේත් නොමැති නම් ඒ ප්‍රවේශය තමයි මේ ජාතික නවෝත්පාදන උපකාරක සේවා මධ්‍යස්ථානය කියන්නේ. මීට කලින් අපි මේ සම්බන්ධව උත්සාහ දැරුවත් එය අපට ඉටු කරගැනීමට හැකියාව ලැබුණේ නැහැ. නමුත් පසුගිය කාලයේ සිදු කරන ලද ඉල්ලීම් අනුව ජනාධිපතිතුමාගේ මෙන්ම ඇමැතිතුමාගේ අවධානය හා මැදිහත්වීම මත ප්‍රයෝගික වැඩපිළිවෙලක් ලෙස මෙය ක්‍රියාවට නැංවීමට හැකියාව ලැබී තිබෙනවා. ඒ අනුව පසුගිය අයවැයෙන් නවෝත්පාදන උපකාරක සේවා මධ්‍යස්ථාන පිහිටුවීමට රු.මි. 100ක මුදලක් අප ආයතනය වෙත වෙන් වුණා. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (නර්ඩ්), යාපනය විශ්වවිද්‍යාලය, හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය යන මධ්‍යස්ථාන තුනෙහි උපකාරක සේවා මධ්‍යස්ථාන 3ක් පිහිටුවීමට තීරණය කළා. ඒ අනුව නර්ඩ් මධ්‍යස්ථානය වෙත අවශ්‍ය මුදල් වෙන් කර එහි ව්‍යාපාරික නවෝත්පාදන සේවා මධ්‍යස්ථානය ස්ථාපිත කර, පසුගිය නොවැම්බර් මාසයේ දී විවෘත කිරීමට අපට හැකි වුණා. ඒ වගේම තව නොබෝ දිනකින් අනෙක් සේවා මධ්‍යස්ථාන 02ත් අපි ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් වෙනුවෙන් විවෘත කිරීමට කටයුතු කරනවා. ඒ අනුව ශ්‍රී ලංකාවේ පළමු වතාවට නව නිපැයුම්කරුවන්ගේ කොමිසම යටතේ නවෝත්පාදන උපකාරක සේවා මධ්‍යස්ථාන ස්ථාපිත වී තිබෙනවා. ඒ ඔස්සේ අපි බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලාංකීය නව නිපැයුම් මේ මධ්‍යස්ථාන ඔස්සේ වෙළෙඳපොළ දක්වා ගෙන යාමටයි. එතනදී එම නව නිපැයුම් හරහා ජාතික අර්ථිකයට දායකවීමත් අපේ තවත් අරමුණක්. අද වන විට නොමිනිය හැකි තරම් ඉතාම පහත මට්ටමක ඇති මේ දායකත්වය මේ ක්‍රියාවලිය හරහා ඉහළ නැංවීමේ බලාපොරොත්තුවත් අප සතුයි.

● **නවෝත්පාදන වාණිජකරණ ප්‍රවේශය කෙරෙහි දක්වා ඇති අවධානය පිළිබඳව කතා කළොත්,**

අපි මේ වන විටත් සහසක් නිමැවුම් ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය පාදක කරගනිමින් නව නිපැයුම් වානිජකරණය සඳහා ප්‍රවේශය ලබා තිබෙනවා. තවත් නවතම වැසටහනක් පිළිබඳව කතා කළොත්, ඉනෝවා මයින්ඩ්ස් පිළිබඳව සඳහන් කළ හැකියි. මෙය පාසල් නව නිපැයුම්කරුවන් සඳහාම වෙන් වූ රූපවාහිනී වැඩසටහනක්. මුලදී අපි මේ වැඩසටහන ආරම්භ කළේ නව නිපැයුම්කරුවන්ගෙන්, පාසල් නව නිපැයුම්කරුවන් වෙනමම අයැදුම්පත් කැඳවලා සහසක් නිමැවුම් වගේම වැඩසටහනක් ලෙසිනුයි. නමුත් ලබන වසරේ සිට අපි සහසක් නිමැවුම් පාසල් අංශයේ ජයග්‍රාහකයන්ගේ නව නිපැයුම් වාතිජකරණය කරනු ලබන තෝතැන්නක් බවට ඉනෝවා මයින්ඩ්ස් වැඩසටහන පත් කිරීමට බලාපොරොත්තු වෙනවා. තමන්ගේ නව නිපැයුම වෙළෙඳපොළ ආක්‍රමණය කළ යුතුයි කියන අභියෝගය මත වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. ඒ අනුව අපි ඉනෝවා මයින්ඩ්ස් වැඩසටහන මේ නව නිපැයුම්වල සෘජු වෙළෙඳ ප්‍රචාරණ මාධ්‍යයක් බවට පත්කර ගැනීමට කටයුතු කරනවා. ඒ අනුව අප හරහා එකතු වන පාසල් නව නිපැයුම්වල වාණිජකරණ ප්‍රවේශය ලෙස මෙය හඳුන්වා දිය හැකියි.

● **වෙළෙඳපොළ ජයගැනීම උදෙසා නව නිපැයුම්කරුවන් සඳහා ලබා දෙන සහාය කෙබඳුද?**

වෙළෙඳපොළ ජය ගැනීමේ අභිප්‍රාය ඇති නව නිපැයුම්කරුවන්ට සහසක් නිමැවුම් ඉතාම හොඳ අවස්ථාවක්. ඒ වගේ ම නව නිපැයුම්කරුවන්ට වෙළෙඳපොළ ජයග්‍රහණය උදෙසා අවශ්‍ය මගපෙන්වීම සහ උපකාරයන් වෙනුවෙන් අපි නිරන්තරයෙන් ම සහාය දක්වනවා. නවෝත්පාදන ආර්ථිකයක් සඳහා දායක වන්නේ ශ්‍රී ලංකා නව නිපැයුම් කොමිසම යි. නමුත් මෙහිදී වැදගත්ම කරුණක් වන්නේ පුද්ගල ආකල්පවල ධනාත්මක සහ නිවැරුදිභාවයයි. නවෝත්පාදකයන්ගේ චින්තන රටාව වෙනස් විය යුතුයි. බොහෝවිට නව නිපැයුම්කරුවාගේ චින්තනය පවතින්නේ සිය නිෂ්පාදනය අවසන් කිරීම දක්වා පමණයි. නමුත් වෙළෙඳපොළ කියන කාරණය දක්වා ඔවුන්ගේ චින්තනය වර්ධනය විය යුතුයි. මෙහි දී වානිජකරණය කියන්නේ සුපිරි වෙළෙ ඳසල්වල විකිණීමට තිබෙන නව නිපැයුම පමණක් ම නොවන බවත් කිව යුතුයි. උදහරණයක් ලෙස ඇතැම් නිපැයුම් වෛද්‍ය ක්ෂේත්‍රය තුළ ඉතාම ප්‍රචලිතව භාවිත වෙනවා. ඒවා සුපිරි වෙළෙඳසල්වල මිලදී ගන්න නැහැ. නමුත් මෙය නවතම නිෂ්පාදනයක්. අපේ නිෂ්පාදන ආර්ථිකය තුළ කෙලින් සිට ගැනීමට නම් යාන්ත්‍රීකරණය කරා පියනැඟීමට සිදු වෙනවා. ඒ සඳහා නව නිපැයුම්කරු ආත්ම ශක්තියෙන් හෙබි පුද්ගලයකු විය යුතුයි. ජය පරාජය සමව දරා ගනිමින් තම ඉලක්කය සපුරා ගැනීමට ආත්ම විශ්වාසයෙන් කටයුතු කළ යුතුයි. ඒ අනුව අප මේ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු අප දිගින් දිගටම පවත්වනවා. නව නිපැයුම්කරු මංමුලා නොවන නිවැරදි මාර්ගය අප කියා දෙනවා.

ඒ වගේම නව නිපැයුම් පිළිබඳ රහස්‍යභාවය, විශ්වාසය සහ වගකීම් සහිත බව උපරිමයෙන් රැඳි ආයතනයක් ලෙස ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම අපට හඳුන්වා දෙන්න පුළුවන්. විශේෂයෙන්ම කිව යුතුයි විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා සෑම අවස්ථාවකම නව නිපැයුම්කරුවන්ගේ ගැටලු පිළිබඳව කටයුතු කිරීමට සැදී පැහැදී සිටිනවා. දැන් ඔබේ විශ්වාසය මත නිවැරුදි ගමනක් යාමට අපි මග විවර කර අවසන්.

● **නවෝත්පාදන කඩිනම් වැඩපිළිවෙළ යටතේ නව නිපැයුම් වෙළෙඳපොළ ජයග්‍රහණය හා සමව ඉල්ලුමට අනුව සැපයීමේ ගැටලු සඳහා විසඳුම් හිමි වන්නේ කෙසේද?**

ඇත්තෙන්ම නව නිපැයුමක් කිරීම, එය වෙළෙඳපොළ දක්වා ගෙන යාම සිදු වුවත්, වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන සැපයුමකට යාමට නිපැයුම්කරුට ආර්ථිකමය හැකියාවක් නොමැති තැන ඔවුන් විශාල අර්බුදයකට මුහුණපානවා. මේ නිසා තමයි අමාත්‍යතුමාගේ මැදිහත්වීම මත රු.මි. 100ක අරමුදල් යටතේ නවෝත්පාදන කඩිනම් වැඩපිළිවෙළ යටතේ මූලික නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා අත්වැල සැපයීමට පියවර ගෙන තිබෙනන්නේ. මේ මූලික ක්‍රියාවලිය ඉටු කිරීම හරහා එහි ශක්‍යතා දැකීමෙන් රජය සහ අනෙකුත් අමාත්‍යාංශත් අප සමග අත්වැල් බැඳ ගනී කියන විශ්වාසය අප තුළ තිබෙනවා. නවෝත්පාදන නිෂ්පාදන හැකියාවේ ප්‍රායෝගිකභාවය අද අපි පෙන්වමින් සිටිනවා. උද. ලෙස පරිසර හිතකාමී ඇසුරුම් ආනයනයෙන් තොරව අද එම අප රට තුළම සිදු කරමින් සිටිනවා. ඒ අනුව මේ වනවිට අප නිපැයුම් බොහෝම විශ්වාසදයි, ප්‍රශස්ත වූ ස්ථාවර කඩිනම් ගමනක ගමන් කරමින් සිටිනබව වගකීමකින් යුතුව ප්‍රකාශ කරනවා. ඒ වගේම 2018 වසර කියන්නේ 2017 වසර තුළ අප අරමුණු කර දේවල්වල ඵල නෙළන වසරයි. මේ සෑම කටයුත්තකදීම සහකාර කොමසාරිස් ධුරයන්හි කටයුතු කරන එච්. එම්. ආර්. කිරිඇල්ල මහතා හා කල්පනී රාජපක්ෂ මහත්මිය ප්‍රමුඛ ආයතනයේ කාර්ය මණ්ඩලයෙන් ලැබෙන්නාවූ අසීමිත සහාය මා විශේෂයෙන්ම අගය කරනවා.

> ***" නව නිපැයුම් පිළිබඳ රහස්‍යභාවය, විශ්වාසය සහ වගකීම් සහිත බව උපරිමයෙන් රැඳි ආයතනයක් ලෙස ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම අපට හඳුන්වා දෙන්න පුළුවන්.***


**ඩබ්. ඒ. එස්. නිසංසලා කුමාරි**
**ඡායාරූප - සරත් පීරිස්**


## 2017 පියසටහන්

***ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ 1979 අංක 53 දරන පනත ඔස්සේ බලාත්මක කරනු ලැබූ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සිය කාර්යභාරය 2017 වසර පුරාවට දේශීය නව නිපැයුම්කරුවන් වෙනුවෙන් බොහෝ ප්‍රයෝජනවත් අයුරින් පුළුල් පරාසයක විහිදුවාලන්නට සමත් විය.***

### කොමිසමේ කාර්යභාරය

ශ්‍රී ලංකා පුරවැසියන් විසින් නව නිපැයුම් කරනු ලැබීම හෝ නිර්මාණය කරනු ලැබීම සඳහා ඔවුනට දිරිදීම, නව නිපැයුම්කරුවන් සඳහා තාක්ෂණික, මූල්‍යමය හා නෛතික සහාය ලබාදීම, ඔවුන්ගේ නිපැයුම්වල සුරක්ෂිතභාවය සඳහා බුද්ධිමය දේපළ හිමිකම ලබාගැනීමට මඟපෙන්වීම, කෘෂිකර්මය, රසායන විද්‍යාව වෛද්‍ය විද්‍යාව පොදු කර්මාන්ත ආදි වූ විවිධ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ජනාධිපති සම්මාන පිරිනැමීම, නව නිපැයුම්කරුවන්ගේ පර්යේෂණ කටයුතු සඳහා සහාය ලබාදීම, අන්තර්ජාතික තරග නියෝජනයට අවස්ථාව සලසාදීම, යොවුන් නිර්මාණශීලීත්වය වැඩි දියුණු කිරීම හා ඊට ධෛර්ය දීම යනාදී වූ කර්තව්‍යයන් රැසක් පනත මඟින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත පවරා දී ඇත. මේ කාර්යභාරය මනාව අවබෝධ කරගනිමින් නියමු ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරමින් ඒවා පුළුල් පරාසයකට ගෙන යන වත්මන් කොමසාරිස් ආචාර්ය සී. මහේෂ් එදිරිසිංහ මහතා ප්‍රමුඛ කොමිසමේ සහකාර කොමසාරිස් ධුරයන් හි කටයුතු කරන එච්.එම්.ආර්. කිරිඇල්ල මහතා හා කල්පනී රාජපක්ෂ මහත්මිය විසින් ඉටු කරන්නා වූ මෙහෙය සුවිශේෂී වේ.




### ක්‍රියාකාරීත්වය

දේශීය නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම්කරණයට දිරිදෙනු වස් ප්‍රධාන ව්‍යාපෘති රැසක් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් ක්‍රියාවට නංවනු ලබයි.

### 'ජනාධිපති සම්මාන ප්‍රදනය'

සම්මාන ප්‍රධානයන් අතරින් මෙය ප්‍රමුඛත්වයක් ගනී. එක් එක් වර්ෂයට අදළ ව බුද්ධිමය දේපළ හිමිකම ලබාගත් නව නිපැයුම් විවිධ ක්ෂේත්‍රයන්ට අදළව ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ප්‍රවීන විනිසුරු මඩුල්ලකගේ මැදිහත්වීමෙන් විනිශ්චයට ලක් වේ. ක්ෂේත්‍රගත ජයග්‍රාහකයන් මෙන්ම පොදුවේ වසරේ හොඳම නව නිපැයුම සඳහා ද සම්මාන ප්‍රදනය කරනු ලබයි. මෙය නව නිපැයුම්කරුවකුගේ ගමන් මගෙහි අමරණීය සන්ධිස්ථානයකි.






### 'සහසක් නිමැවුම්' ජාතික නව නිපැයුම් හා නවොත්පාදන ප්‍රදර්ශනය

මේ ප්‍රදර්ශනය අදියර කිහිපයකින් සමන්විත වන අතර දැනුවත් කිරීමේ පළාත් සම්මන්ත්‍රණවලින් අනතුරුව විධිමත් ක්‍රමවේදයන් ඔස්සේ පළාත් නව නිපැයුම් තරග පවත්වනු ලබයි. ජාතික තලයෙන් ජයග්‍රහණ අත්කර ගන්නා නව නිපැයුම් ජාත්‍යන්තර තරග බිම නියෝජනයට සුදුසුකම් ලබයි. මේ වසරේ දී ද 'සහසක් නිමැවුම්' ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය හය වැනි වරට ඉතාමත් සාර්ථක අන්දමින් පවත්වන්නට යෙදුණ අතර, නව නිපැයුම් හාර සියයකට ආසන්න සංඛ්‍යාවක් ක්ෂේත්‍ර දහතරක් නියෝජනය කරමින් ප්‍රදර්ශනයට ඉදිරිපත් කර තිබුණි. ජයග්‍රාහී නිපැයුම්කරුවන් හට ජාත්‍යන්තර තරග අවස්ථා රැසක් සඳහා සහභාගී වීමට ද කොමිසම විසින් අවස්ථාව ලබා දී ඇත. මෙහිදී 'සහසක් නිමැවුම්' ජාතික ප්‍රදර්ශනයට සුදුසුකම් ලබන පාසල් අංශයේ නව නිපැයුම්කරුවන් වෙනුවෙන් ජාතික ප්‍රදර්ශනයට පූර්වයෙන් "ඉදිරිපත් කිරීමේ කුසලතා සංවර්ධන වැඩමුළු" (Presentation Skills Development Workshop) පැවැත්වීම ද විශේෂත්වයකි. ජාතික ප්‍රදර්ශනයේ දී පැකිලීමකින් තොරව සාර්ථකව තම නිර්මාණය පිළිබඳව විග්‍රහ කිරීමේ අවස්ථාව එමඟින් ඔවුන්ට හිමි වේ.එපමණක් නොව ජයග්‍රහණය ලබන නව නිපැයුම්කරුනවන්ගේ නිපැයුම් වානිජකරණයට අවශ්‍ය සහාය ලබා දීමේ වැඩසටහන් මාලාවක් "නව නිපැයුම් දිරිය" නමින් ක්‍රියාත්මක කිරීමට කොමිසම කටයුතු කරයි. මෙහිදී නව නිපැයුම් සඳහා මූල්‍යාධාර, තාක්ෂණික සහාය, නව නිපැයුම් වැඩි දියුණු කිරීමේ සහාය, පොලී රහිත ණය ලබා දීම, මූලාකෘති සැකසීමට සහාය වීම මෙන්ම නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමට සහාය වීම යනාදී අවශ්‍යතා පදනම් කරගන්නා අතර ප්‍රගතිය පිළිබඳව පසු විපරමක් සිදු කෙරේ.





### නව නිපැයුම් වාණිජකරණ ප්‍රවේශය

තවද ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම්කරණ කුසලතාවන් වෙළෙඳපොළ දක්වා ගෙන යාමටත්, පර්යේෂණ සඳහා සහාය දක්වමින් ඒවා මුදල් බවට පරිවර්තනය කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමත් වෙනුවෙන් Innovation Accelerator Funding Mechanism for Sri Lanka (IAFM-SL) ව්‍යාපෘතිය විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත පවරා ඇත. මෙය කොමිසමේ පනත මඟින් දක්වා ඇති මූල්‍යාධාර ලබාදීමේ ක්‍රමවේදය තවදුරටත් ස්ථාවර හා පුළුල් පරාසයකට විහිදුවමින් නව නිපැයුම් වාණිජකරණය දක්වා සහාය ලබාදීම වෙනුවෙන් ක්‍රියාත්මකය.

*06 වැනි පිටුවට...*

# පේටන්ට් බලපත්‍ර දෙකකට හිමිකම්...

### පළමු පේටන්ට් බලපත්‍රය

ජාතික විද්‍යා පදනම මඟින් 2015 වසරේ මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ මහාචාර්ය රංගික උමේෂ් හල්වතුර මහතාට පිරිනමන ලද පර්යේෂණ අරමුදල (RG/2015/EA & ICT/02) යටතේ, අදාළ පේටන්ට් බලපත්‍ර 02 ක් හිමිකර ගැනීමට ඔහුගේ පර්යේෂණ කණ්ඩායම සමත් වී ඇත. මේ පර්යේෂණයේ සංකල්පය වන්නේ, මඩ කොන්ක්‍රීට් (Mud – Concrete) ගොඩනැගිලි, අමුද්‍රව්‍ය මඟින් ස්වයං – සම්පීණ්ඩිත, ගොඩනැගිල්ලේ බර ඔසවා තැබිය හැකි (කණු හෝ බාල්ක රහිත) බිත්ති පද්ධතියක් නිර්මාණය කිරීමයි. (Investigation of Mud – Concrete for in – situ cast load-bearing walls) මේ පර්යේෂණයේ දී පළමු පේටන්ට් බලපත්‍රය, සම්පීණ්ඩිත බර ඔසවා තැබිය හැකි මඩ කොන්ක්‍රීට් බිත්ති පද්ධතිය (Self-Compacting in-situ cast Mud- Concrete load – bearing walls) සඳහා පේටන්ට් අංකය – 18762 යටතේ 2016 වසරේ දී හිමි විය.




මෙලෙස සොයාගන්නා ලද බිත්ති පද්ධතිය සාමාන්‍ය ගඩොල් බිත්තියකට වඩා ශක්තිමත් අතර, කිසිදු කණු හෝ බාල්ක (කොන්ක්‍රීට්) යොදාගැනීමකින් තොරව තට්ටු 03ක් දක්වා ඉදිකිරීමේ හැකියාව ඇත. මෙහි එක් බිත්ති කොටසක් මිලි මීටර 1200 දක්වා ඉහළට බැඳිය හැකි වන අතර , නිවස අභ්‍යන්තරයේ භාවිත කරන බිත්ති මිලි මීටර 100 ඝනකමට ද, බාහිර බිත්ති මිලි මීටර 150 ඝනකමට ද ඉදිකිරීමේ හැකියාව ඇත. තවද ඉසිලීමට නියමිත බරෙහි ස්භාවය අනුව, බිත්තිවල ඝනකම සකස් කළ හැකි අතර, කම්බි යොදා ගනිමින් බිත්ති කොටසෙහි බර ඉසිලීමේ හැකියාව ඉහළ නැංවිය හැකිය. එමෙන්ම මේ පරීක්ෂණය මඟින් බිත්ති පද්ධතිය සඳහා අවශ්‍ය හොඳම මිශ්‍රණය ද සොයාගන්නා ලදි. එහිදී සිමෙන්ති අවම වශයෙන් 4% ක් ද, සියුම් වැලි <8% (≤ පෙරණ ප්‍රමාණය මිලි මීටර 0.425), වැලි 50 % – 50% (පෙරණ පරිමාණය මිලි මීටර 0.425<වැලි<මිලි මීටර 4.75) සහ බොරළු 35 % – 35 % (පෙරණ ප්‍රමාණය මිලිලීටර 4.75<බොරළු<මිලි ලීටර 35) යොදාගනී. එමෙන්ම, ජලය යොදාගනු ලබන්නේ සම්පූර්ණ මිශ්‍රණයේ වියළි බරෙන් 18% – 20% ප්‍රමාණයක් පමණි. එපමණක් නොව මේ නව බිත්ති පද්ධතිය දේශීය අවශ්‍යතා සඳහා පහසුවෙන් අනුගත විය හැකි, දේශීය අමුද්‍රව්‍යයවලින් නිපදවන ලද තිරසර, අඩු වියදම්, කඩිනම් ඉදිකිරීම් ශිල්පයක් ලෙස හඳුන්වා දිය හැකිය.

### දෙවැනි පේටන්ට් බලපත්‍රය

පස් ආශ්‍රිත අමුද්‍රව්‍යවලින් ස්වයං සම්පීණ්ඩිත බර ඔසවා තබාගත හැකි බිත්ති නිර්මාණයේ දී යොදාගත හැකි නව රාමු පද්ධතියක් (Modular formwork system for in-situ cast walls made from self – compacting soil based materials) නිපදවීම සඳහා පේටන්ට් අංක 18879 යටතේ 2017 වසරේ දී හිමි විය.

මේ රාමු පද්ධතිය ප්‍රධාන වශයෙන් බලපෑ හැකි බර (ජල හා පාංශු පීඩන, සුළඟ) මත පදනම් කරගනිමින් නිර්මාණය කරන ලදි. පළමුව, පරිගණක ආකෘති නිර්මාණ මඟින් මේ රාමු පද්ධතියට අවශ්‍ය අවම ආධාරක ප්‍රමාණය තීරණය කරන ලද අතර, ඒ සඳහා බලපෑ හැකි සියලු සාධක (නැමීම, අපගමනය, ස්වයංසම්පීණ්ඩිත අමුද්‍රව්‍යය නිසා ඇති විය හැකි පීඩනය) සලකා බලන ලදි. අමුද්‍රව්‍යය නාස්තිය අවම වන ලෙස, කඩනමින් පිරිසිදු කළ හැකි, හොඳ මතුපිටක් බිත්තියට ලබාදෙන, පිටතට මිශ්‍රණය ගලා නොයන පරිදි සියලුම සන්ධි සංවෘත වන ආකාරයට සරල තාක්ෂණයක් උපයෝගී කර ගනිමින් මේ පද්ධතිය නිර්මාණය කර ඇත.

එපමණක් නොව මෙම තාක්ෂණය තුළ ඉතා පහසුවෙන් හා ආරක්ෂිතව මේ රාමු පද්ධතිය බිත්තියෙන් ඉවත් කිරීමේ ක්‍රමවේදයන් ද හඳුන්වා දී ඇති අතර, මූලික නිමැවුම් පිරිවැය හා කම්කරු ශ්‍රමය සඳහා වැය වන මුදල අවම කරගැනීමේ ක්‍රම වේදයන් ද හඳුන්වා දී ඇත.



04-05 පිටුවෙන්...

## 2017 පියසටහන්...

### උපකාරක සේවා මධ්‍යස්ථාන

නවෝත්පාදන අදහස් යථාර්ථයක් බවට පත් කරලීමේ අරමුණ මුදුන්පත් කිරීම වෙනුවෙන් ජාතික නවෝත්පාදන උපකාරක සේවා මධ්‍යස්ථාන (National Incubation Centres) දිස්ත්‍රික්ක 5ක් මූලික කරගෙන ක්‍රියාත්මක කිරීමට විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ අනුමැතිය ලබාදී තිබේ. ඒ අනුව නව නිපැයුම්කරුවන් සඳහා නිපැයුම් මවන්නා වූ තෝතැන්නක් නිර්මාණය කිරීමේ කාර්යභාරයට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම උර දී සිටී.

### ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් වෙනුවෙන් ජාතික දිනයක් ප්‍රකාශයට පත් කිරීමද නව නිපැයුම්කරණය ප්‍රබෝධමත් කිරීමෙහි ලා බලපා තිබේ. ජනාධිපතිතුමාගේ සහ සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ දැඩි කැපවීම හා මඟපෙන්වීම මත ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය ලෙස ඔක්තෝබර් මස 26 වැනි දිනය නම් කරන ලදී. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රථම කොමසාරිස් ධූරය හෙබවූ දේශබන්දු ආචාර්ය ඒ. එන්.එස්. කුලසිංහ මහතාට කරන ගෞරවාචාරයක් ලෙස එතුමන් ගේ ජන්ම දිනය පාදක කර මේ දිනය නම් කර ඇත.

මෙලෙස ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය ප්‍රකාශයට පත් කිරීම මඟින් නව නිපැයුම්කරුවා ඇගයීමට ලක්වනවා පමණක් නොව නවෝත්පාදන ආර්ථිකයක් කරා රට ගෙන යාම සඳහා ජනතාව දිරිගැන්වීමට ප්‍රවේශයක් ලබාගැනීම ද අපේක්ෂා කෙරේ. තවද ජාතික දිනයක් ප්‍රකාශයට පත් කිරීම මඟින් නිපැයුම්කරුවන් වෙත සෙසු ප්‍රජාවගේ විශේෂ අවධානය යොමු වනවා සේම ඔවුනට අවශ්‍ය ආයෝජන අවස්ථා වෙළෙඳපොළ අවස්ථා සහ වෙනත් උපකාර ලබාගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව ද පුළුල් වේ.

### නව නිපැයුම්කරුවන්ට හැඳුනුම්පතක්

එමෙන්ම දේශීය නව නිපැයුම්කරුවාගේ වටිනාකමට නිසි ඇගයීමක් ලබාදෙමින් ඔවුනට සුවිශේෂී පිළිගැනීමක් ලබා දීමේ අරමුණ ඇතිව නව නිපැයුම්කරුවන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීමට ද කොමිසම පියවර ගෙන තිබේ. මේ හැඳුනුම්පත විශේෂිත නිර්ණායකයන්ට අනුකූලව කොමිසමේ පූර්ණ අධීක්ෂණය යටතේ නිකුත් කෙරෙන අතර හැඳුනුම්පත් හිමි කර ගත් සියලුම නව නිපැයුම්කරුවන්ගේ තොරතුරු මහජන සේවාවන් සපයනු ලබන සෑම ආයතනයක් වෙතම යොමු කරමින් මාර්ග ගත අන්තර්ජාල ප්‍රවේශයන් ඔස්සේ තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදයකට ඇතුළත් කෙරේ.

### පාසල් නව නිපැයුම්කරුවන්

අනාගත ශ්‍රී ලංකාව තුළ නවෝත්පාදන සංස්කෘතියක් බිහිකිරීමට සුවිසල් දායකත්වයක් සපයමින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම පාසල් ක්ෂේත්‍රයේ නව නිපැයුම්කරුවන්, යොවුන් නව නිපැයුම්කරුවන් සඳහා වැඩසටහන් ගණනාවක් ම ක්‍රියාත්මක කරනු ලබයි. 'සහසක් නිමැවුම්' ප්‍රදර්ශනය තුළ වැඩිහිටි අංශයන්ට සමගාමීව පාසල් අංශය නියෝජනයට ද අවස්ථාව සලසා දී ඇති අතර ජාත්‍යන්තර තරග ප්‍රවේශයට ද පුළුල් අවකාශයක් සලසා ඇත.

### ඉනෝවා මයින්ඩ්ස්

ඉනෝවා මයින්ඩ්ස් යනු යොවුන් නව නිපැයුම්කරුවන් සඳහාම වෙන්වූ නියමු ව්‍යාපෘතියකි. මෙය නිර්මාණශීලි ශිෂ්‍ය ප්‍රජාව නව නිපැයුම් දැනුමෙන් සන්නද්ධ කිරීම උදෙසාම ක්‍රියාවට නැංවෙන සුවිශේෂී විද්‍යුත් මාධ්‍ය වැඩසටහනකි. පළමු වතාවට 2016 වසරේ දී කළ එළි නැංවුණු 'INNOVA MINDS' ආරම්භ වූයේ තරගකාරීත්වයෙන් ඔබ්බට යමින් ජාතිකමය, සමාජමය හා වාණිජමය වටිනාකමින් යුතු නව නිපැයුම් දේශීය ආර්ථිකයට දායාද කරවීමේ වටිනාකම දරුවන්ට අවබෝධ කරවීම පෙරදැරිවය. 2016 වසරේ මෙන්ම 2017 වසරේ දී ද සාර්ථකව පවත්වන්නට යෙදුණ මේ වැඩසටහන ජාතික නාලිකාව ඔස්සේ විකාශය කරන ලදී. අවසන් වටයට සුදුසුකම් ලද නව නිපැයුම්කරුවන් කොමිසමේ පූර්ණ අනුග්‍රහය මත ඉන්දුනීසියාවේ ජකර්තා නුවර පැවැති International Young Inventors Award ((IYIA) 2017 තරගය සඳහා සහභාගී කරවූ අතර අවසන් වටයට සුදුසුකම් නොලද නව නිපැයුම්කරුවන් කොමිසමේ පූර්ණ අනුග්‍රහය මත දකුණු කොරියාවේ පැවැති Korea International Youth Olympiad (KIYO 2017) කණ්ඩායම් තරගය සඳහා සහභාගී කරවන ලදී.

### මාධ්‍ය ප්‍රතිපත්තිය

සන්නිවේදන තාක්ෂණයන් විසින් මුළු විශ්වයම මිට මොලවා ඇති අවස්ථාවක ජනමාධ්‍යයට කළ හැකි කාර්යභාරය අති මහත්ය. නවෝත්පාදන ආර්ථිකයක් හඹා යන ගමනේ දී එම හැකියාව අත් වැලක් කර ගැනීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම උත්සුක වන අතර විද්‍යුත් මාධ්‍ය මුද්‍රිත මාධ්‍ය හා සමාජ ජාල වෙබ් අඩවි ඔස්සේ නව නිපැයුම් මහජනතව අතර ප්‍රචලිත කිරීමටත්, ඒ ඔස්සේ ප්‍රබල වාණිජකරණ විභවයක් ඇති එහෙත් සමාජගත කරගැනිමට අවස්ථාවක් නොලද නිපැයුම් වෙළෙඳපොළ වෙත ප්‍රවේශ කරවිමටත් දේශීය නව නිපැයුම් කෙරෙහි ජනතා ආකර්ශණය හිමි කරදීමටත් පියවර ගැනීම අභිප්‍රාය වී ඇත. එය යථාර්ථයක් බවට පත් කරමින් 2017 අගෝස්තු 31 වැනි දින විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් මාධ්‍ය ප්‍රතිපත්තිය හඳුන්වාදීමේ වැඩසටහනක් පවත්වන ලදී.

### නීල හරිත වැඩසටහන

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය එක්ව සංවිධානය කළ නීල හරිත වැඩසටහන් මාලාවේ නියමු වැඩසටහනක් (Sri Lanka NEXT - Blue Green Era Programme 2017) ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් 2017 ඔක්තෝබර් මස 16 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ නුග සෙවණ ශාලාවේ දී සාර්ථක අන්දමින් පවත්වන ලදී. මෙහි අරමුණ වූයේ ශ්‍රී ලංකාව තුළ නීල හරිත පරිසරයක් ගොඩනැංවීම හා හරිත ආර්ථිකය නංවාලීම වෙනුවෙන් නව නිපැයුම් දයක කරගත හැක්කේ කෙසේද යන්න විමසා බැලීමයි. ඒ අනුව හරිත ආර්ථිකයට සහයෝගය දක්වන නව නිපැයුම් හිමි නිපැයුම්කරුවන් ඇතුළු ඊට රුචිකත්වයක් දක්වන හාරසියයකට අධික පිරිසක් මේ වැඩසටහන සඳහා එදින සම්බන්ධ කරගැනීමට කොමිසමට හැකියාව ලැබුණි.

### ශක්‍යතා වර්ධනය

මේ සෑම ව්‍යාපෘතියක් ම අතරතුර නව නිපැයුම්කරුවන්ගේ ශක්‍යතාව වර්ධනය කිරීම උදෙසා විවිධ වැඩමුළු සංවිධානය කිරීමට ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම කටයුතු කිරීම සුවිශේෂී වේ. ඔවුන්ගේ නිර්මාණශීලි හැකියාවන් පුබුදු කරවමින් නව මානයන් ඔස්සේ සිතීමට පෙළඹවීම මෙමඟින් අපේක්ෂිතය.

ඒ සඳහා වන ප්‍රථම තෙදින වැඩමුළුව 2017 අගෝස්තු 16 සිට 18 දින දක්වා කුකුලේගඟ දී පවත්වන ලදී. මේ අවස්ථාව එකිනෙකාගේ අදහස් හුවමාරු කරගැනීමටත් කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමටත් අතිශයින් ප්‍රයෝජනවත් විය.



පෘථිවියට ළඟම ස්වභාවික ආකාශ වස්තුව කුමක්ද? රාත්‍රී අහසෙහි වඩාත් දීප්තිමත්ව පෙනෙන ආකාශ වස්තුව කුමක්ද? මේ ප්‍රශ්න දෙකටම ඇත්තේ එකම පිළිතුරකි. එනම් හඳ හෙවත් චන්ද්‍රයා යි.

# හඳු

## අපට අහිමි වෙයිද?



### චන්ද්‍රයා

බෞද්ධ දර්ශනයත් සමග ඉතාමත් ළඟින් බැඳුණු ආකාශ වස්තුවක් වන හඳ පෘථිවියට අයත් එක ම උප ග්‍රහයා වේ. සෞරග්‍රහ මණ්ඩලයේ බ්‍රහස්පති ග්‍රහලෝකයට උප ග්‍රහයින් 69 ක් ද, සෙනසුරුට උප ග්‍රහයින් 62ක් ද, යුරේනස්ට උප ග්‍රහයින් 27ක් සහ නෙප්චූන්ට උප ග්‍රහයින් 14 ක් වශයෙන් ද පිහිටයි. මේ ග්‍රහලෝකවල උප ග්‍රහයින් ඒ ඒ ග්‍රහලෝකවලට අයත් ස්වභාවික චන්ද්‍රිකා ලෙස ද සලකයි.
පෘථිවියට අයත් චන්ද්‍රයා අනෙකුත් චන්ද්‍රයන් සමග සලකා බලන විට විශාලත්වයෙන් පස් වැනි ස්ථානයේ පවතියි.
අපේ සෞරග්‍රහ මණ්ඩලය බිහිවී ඇත්තේ මීට වසර බිලියන 4.6 කට ඉහත දී වන අතර, චන්ද්‍රයා බිහිවී ඇත්තේ ඊට වසර වසර මිලියන 50 කට පමණ පසුව බව විශ්වාස කෙරේ. එමෙන්ම අඟහරු තරම් වූ ආකාශ වස්තුවක් පෘථිවියෙහි ගැටීමෙන් ඇතිවූ පිපුරුම සමග පාෂාණ කොටස් එක් වී චන්ද්‍රයා නිර්මාණය වී ඇති බව ද විශ්වාස කෙරේ.

### ඔබ දන්නවාද?

ඔබ දන්නවාද හඳ වසරකට සෙ.මී. 3.8 ක් පමණ අපේ පෘථිවියෙන් ඈත් වන බව? මෙසේ වීමට හේතුව ඉහත සඳහන් පිපිරුම බවටද විශ්වාසයක් පවතී. මේ ඈත්වීම දිගින් දිගටම පැවතුණහොත් කෙදිනක හෝ හඳ අපේ පෘථිවියට අහිමි වෙයිද? නැත. එසේ විය නොහැකිය. කෙදිනක හෝ කෝණික ගම්‍යතාව, ගුරුත්වාකර්ෂණ බලය සමග සමතුලිතවී හඳ පෘථිවියෙන් ඈත්වීම නවතිනු ඇත. හඳෙහි ප්‍රමාණය සැලකුවිට එහි විෂ්කම්භය කි.මී. 3,475 ක් පමණ වන අතර, පෘථිවියෙහි විෂ්කම්භය කි.මී. 12,742 පමණ වේ. ඒ අනුව හඳෙහි විශාලත්වය පෘථිවියේ විශාලත්වයෙන් 1/3 පමණ වන බව පෙනේ. හඳට තම අක්ෂය වටා භ්‍රමණ වීමට ගතවන කාලය දින 27.3 ක් වන අතර හඳට පෘථිවිය වටා පරිභ්‍රමණ වීමට ගතවන කාලය දින 29.5 ක් වේ. එබැවින් සැමවිටම අපට දැකගත හැකි වන්නේ හඳේ එක් මුහුණතක් පමණි.
හඳ අප නොසිතන ආකාරයට පෘථිවි වාසීන්ට ඉතාමත් වැදගත් වන ආකාශ වස්තුවක් බව ඔබ මොහොතකටවත් සිතන්නට නැතිව ඇති. අපි දන්නා පරිදි හඳෙහි පිහිටීම අනුව මුහුදෙහි උදම් රළ ඇතිවේ. මෙය පෘථිවියෙහි ජෛව පරිණාමයට සහ ජෛව විවිධත්වයට බලපාන සාධකයක් ද වේ. එනම්, උදම් රළ ඇතිවන අවස්ථාවල දවසේ යම් කාල සීමාවක් මුහුදු ජල මට්ටම අඩුවී වෙරළ බඩ තීරයේ යම් ප්‍රදේශයක් තාවකාලික ගොඩබිම් තීරුවක් බවට පත්වේ. එවිට මේ තීරුවෙහි සිටින ජීවීන් ගොඩබිම පරිසරයට ද අනුකරණය වීමක් සිදුවේ.මේ ආකාරයට ජලජ ජීවීන් ගොඩබිම් ජීවිතයට අනුගතවීම ජෛව පරිණාමය සඳහා නිදසුනක් ලෙස ගත හැකිය.
එමෙන්ම ඔබ අත්දැකීමෙන් දන්නා දෙයක් තමයි හඳ දීප්තිමත්ව අහසේ පෙනුනත් හැමදාම එකම හැඩයකින් දැකගත නොහැකිවීම . මෙලෙස දවසින් දවස හඳේ හැඩය වෙනස් වී පෙනීම තාරකා විද්‍යාත්මකව 'චන්ද්‍රන කලා ලෙස හඳුන්වයි.




### චන්ද්‍ර කලා

හඳ පෘථිවිය වටා ගමන් කිරීමේ දී සැමවිටම හඳෙහි සූර්යයා දෙසට යොමු වී ඇති අර්ධ ගෝලාකාර කොටසට සූර්යාලෝකය වැටේ. එහෙත් හඳ පිහිටන ස්ථානය අනුව පෘථිවියේ සිටින අපට හඳෙහි දීප්තිමත් අර්ධය පෙනෙන ප්‍රමාණය වෙනස්වීම නිසා චන්ද්‍ර කලා ඇතිවේ.
එම සම්පූර්ණ භාගයම පෘථිවියට දිස් වන්නේ පුර පසළොස්වක පොහොය දිනටයි. එදිනට මේ අර්ධ ගෝලය පෘථිවියේ සිටින අපට පෙනෙන්නේ පැතලි තැටියක් ආකාරයටය.පසළොස්වක දිනක දී හඳ පිහිටන්නේ පෘථිවියෙන් සූර්යයා පිහිටන පැත්තට ප්‍රතිවිරුද්ධ පැත්තේ බැවින් එවිට අපට හඳේ දීප්තිමත් සම්පූර්ණ ප්‍රදේශයම දැකගත හැකි වේ.
පුර පසළොස්වක පසුවී දින 7ක් පමණ ගත වෙද්දී එහි හැඩය ක්‍රමයෙන් අඩු වී හඳ දැකිය හැක්කේ වෘත්තයකින් භාගයක් ලෙසයි. මේ හැඩය අව අටවක ලෙස හැඳින්වේ. මෙදිනට අහස දෙස බැලුවොත් හඳේ දීප්තිමත් භාගය පිහිටන්නේ නැගෙනහිර දිශාවටයි.
අව අටවක පසුවී තවත් දින 7 ක් ගත වන විට ටිකෙන් ටික හඳේ හැඩය අඩුවී ගොස් අමාවක උදාවේ. අමාවක දිනයක හඳ පිහිටන්නේ පෘථිවිය හා සූර්යයා අතර ප්‍රදේශයේ ය. එදිනට හඳේ දීප්තිමත් අර්ධය සූර්යයා දෙසටත්, අඳුරු අර්ධය පෘථිවිය දෙසටත් පිහිටයි. මේ නිසා අහසේ චන්ද්‍රයා නොපෙනේ.
නැවතත් අමාවක පසුවන විට දිනෙන් දින හඳේ හැඩය ක්‍රමයෙන් වර්ධනය වී දින 7ක් ගත වන විට හඳ වෘත්තයකින් භාගයක් ලෙස දැකිය හැකිය. මෙය පුර අටවක ලෙස හැඳින්වේ. එදිනට අහස බැලුවොත් හඳේ දීප්තිමත් භාගය පිහිටන්නේ බස්නාහිර දිශාවටයි.
පුර අටවක පසුවී තවත් දින 7ක් ගත වනවිට ක්‍රමයෙන් හඳේ හැඩය සම්පූර්ණ වී නැවතත් පුර පසළොස්වක දිනය උදාවේ. මේ අනුව ඔබට හඳේ පුර කලාවල දී එහි බස්නාහිර පැත්ත දීප්තිමත්වත්, අව කලාවන්වලදී නැගෙනහිර පැත්ත දීප්තිමත්වත් දැකිය හැකි බව පැහැදිලි වේ. එසේ නැතිනම් උතුරු දිශාවට පිටු පා සිටගෙන හඳ දෙස බැලූවිට තමන්ගේ දකුණු අත පැත්තේහ භාගය දීප්තිමත් නම් එය පුර කලාවක් ලෙසද වම් අත පැත්තේ භාගය දීප්තිමත් නම් එය අව කලාවක් ලෙස ද, හඳුනාගත හැකිය.
හඳේ මේ සම්පූර්ණ චක්‍රය ගත කිරීමට දින 29 ක් පමණ ගතවේ. මෙහි දැක්වෙන රූපයෙන් ඔබට මේ කලා පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වනු ඇති.

*ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයේ ඉදිරිපත් කිරීමකි.*

## "විද්‍යාතා හරිත කඩමණ්ඩිය"

### සෙත්සිරිපාය කාර්යාල පරිශ්‍රයේදී




විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන ගමට තාක්ෂණය ගෙන යන 'විද්‍යාතා' වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 266ක ස්ථාපිත කර ඇති විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන අරමුණ වන්නේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමයි. මේ හරහා ග්‍රාමීයව පවතින ස්වභාවික සම්පත්වලට වැඩි වටිනාකමක් ලබාදෙමින් නිෂ්පාදන බිහි කරන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් බිහිකිරීම සහ එම ව්‍යවසායකයන්ට අවශ්‍ය විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම සහ මඟපෙන්වීම ලබාදෙමින් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරනු ලබයි.
එළැඹෙන උත්සව සමය වෙනුවෙන්, දිවයින පුරා විසිරී ඇති විද්‍යාතා මධ්‍යස්ථාන මගින් සාර්ථක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් බවට පත්වූ, ව්‍යවසායකයන් අතරින් තෝරාගනු ලැබූ, ජාතික සහ ජාත්‍යන්තර වෙළඳපොළට නිෂ්පාදන යොමු කරන තත්වය දක්වා පැමිණි ව්‍යවසායකයන් 50 දෙනකු ගෙන් සමන්විත පිරිසකගේ වස විසෙන් තොර නිෂ්පාදන හා සේවා ඇතුළත් "විද්‍යාතා හරිත කඩමණ්ඩිය" 2017 දෙසැම්බර් මස 20,21,22 යන තෙදින පුරා බත්තරමුල්ල, සෙත්සිරිපාය පරිශ්‍රයේදී පැවැත්විණි. දේශීය වියළි හා පිසින ලද ආහාර, රසකැවිලි, දේශීය සහල් (හෙළසුවය) බතික් හා තිම් ඇඳුම්, ආභරණ, හස්ත කර්මාන්ත අංශයේ නිෂ්පාදන, පාවහන්, බෑග්, විසිතුරු මල්, කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන හා සේවා, විද්‍යුත් උපකරණ ඇතුළු දේශීයව නිපදවන තවත් බොහෝ දේ මේ වෙළඳපොළ මගින් විශ්වාසවන්තව ලබා ගැනීමට පාරිභෝගිකයන් හට එහිදී අවස්ථාව උදා විය.

උපදේශකත්වය
**උදය ආර්. සෙනෙවිරත්න**
ලේකම්
(විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය)
**ජේ. එම්. මංගලතිස්ස**
රාජ්‍ය ලේකම්
(විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය)
**එච්. එම්. බී. සී. හේරත්**
අතිරේක ලේකම්
(තාක්ෂණ හා පර්යේෂණ සංවර්ධන)
**නන්දනී සමරවික්‍රම**
අතිරේක ලේකම් - (පාලන හා මූල්‍ය)

මෙහෙයවීම
**පී. එම්. ධර්මතිලක**
අධ්‍යක්ෂ - (විද්‍යා හා පර්යේෂණ සංවර්ධන)
**හිමාලි ඩබ්. කේ. අතාවුදගේ**
අධ්‍යක්ෂ - (තාක්ෂණ හා අන්තර්ජාතික සබඳතා)
**නසීමා අහමඩ්** - අධ්‍යක්ෂ (සැලසුම්)
**නිමාලි කුලතුංග** - අධ්‍යක්ෂ (සැලසුම්)
**කේ. අරුණු ප්‍රභා පෙරේරා** -
අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය)
**ඒ. කේ. පී. පීරිස්** -
ප්‍රධාන ගණකාධිකාරී
**එම්. සී. ගමගේ**
ප්‍රධාන අභ්‍යන්තර විගණක

සම සංස්කරණය
**මහේෂ් සමරසේකර** - මාධ්‍ය ලේකම්
0112 - 372288
**ධම්මිකා රත්නායක**
**මධුකා සුභාෂිණී**
**එල්. ඩී. අයි. යූ. කුමාර**
(විද්‍යා හා පර්යේෂණ සංවර්ධන අංශය)

නිල ඡායාරූප
**දුලිප් නයනප්‍රිය**
අමාත්‍යාංශ මාධ්‍ය ඒකකය

LAKE HOUSE
Government Relations Dept.

සම්බන්ධීකරණය / සැලසුම් හා නිර්මාණ අධීක්ෂණය
**සමන්ත කරුණාසේකර**
කළමනාකරණ කර්තෘ - රාජ්‍ය සබඳතා
0112 429297 / 077 3493785

සම්බන්ධිකරණ කර්තෘ
**ප්‍රමිතා රන්දලී පබසරා**
සහාය සංස්කරණය
**ඩබ්. ඒ. එස්. නිසංසලා කුමාරි**
නිර්මාණ ශිල්පී
**ධනුෂ්ක බණ්ඩාර/ අශානි ජයවර්ධන**
ඩිජිටල් ඡායාරූප සැකසුම - නිෂ්පාදන ග්‍රැෆික් අංශය
මුද්‍රණය - ලේක්හවුස් රොටරි මුද්‍රණ අංශය

# සහසක් නිමැවුම් - 2017













ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් සංවිධානය කරනු ලබන **"සහසක් නිමැවුම්"** ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය හය වැනි වරටත් අති සාර්ථක අන්දමින් අවසන් විය. එය පසුගිය සැප්තැම්බර් මස 28, 29, 30 තෙදින පුරා ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

සමාරම්භක උත්සවය විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ මඟ පෙන්වීම මත විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්, උදය ආර්. සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. දේශීය නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ වගකීම් සහිත බලාත්මක ආයතනය ලෙස ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් හැකියාවන් මෙන්ම නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය සවිබලගැන්වීමේ පරමාර්ථයන් ඉටු කරනා අතරතුර ඔවුනට ජාතිකමය වශයෙන් පිළිගැනීමක් ලබාදෙමින් නව නිපැයුමට යෝග්‍ය වූ වෙළෙඳපොළ සොයා ගැනීමට සහාය වීමේ අභිප්‍රාය පෙරදැරිව කොමිසම විසින් සහසක් නිමැවුම් ප්‍රදර්ශනය හා තරඟාවලිය වාර්ෂිකව සංවිධානය කරනු ලබයි.

මේ තරඟාවලිය සියලු පළාත් ආවරණය වන පරිදි පාසල්, විශ්වවිද්‍යාල හා තෘතීයික අධ්‍යාපනය ආයතන, වාණිජකරණය කරන ලද නව නිපැයුම් අංශය හා විවෘත යන අංශ හතර නියෝජනය කරමින් කෘෂිකර්මය, ආහාර තාක්ෂණය, මහජන ආරක්ෂාව හා සුභසාධනය, භෞතික විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඖෂධවේදය හා පරිසර සංරක්ෂණ ආදී ක්ෂේත්‍ර 14ක් යටතේ පවත්වනු ලබයි. 2017 වසර සඳහා ජාතික ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීමට නව නිපැයුම් 400ක් සුදුසුකම් ලබා තිබුණි. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, ජාත්‍යන්තර නව නිපැයුම් සංගමයේ (International Federation of Inventor's Association - IFIA) මෙන්ම ලෝක නව නිපැයුම් බුද්ධිමය දේපළ ආයතනයේ සාමාජිකත්වය හිමි වුයේ 2016 වසරේදී ය. එහි ප්‍රතිඵලයක් ලෙස සහසක් නිමැවුම් ජාතික ප්‍රදර්ශනය සඳහා විදෙස් නියෝජිතයන් සම්බන්ධ කරගැනීමට කොමිසමට හැකියාව ලැබී තිබේ. තවද ලෝක නව නිපැයුම් පිළිබඳ බුද්ධිමය දේපළ සංගමය මඟින් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා වෙත ශ්‍රී ලංකාවේ නව නිර්මාණකරුවන් දිරිගැන්වීමට ලබා දෙන දායකත්වය අගය කරමින් විශේෂ සම්මානයක් ද මෙහිදී පිරිනැමීම විශේෂ අවස්ථාවක් විය. ප්‍රදර්ශනය විවෘත කිරීමේ අවස්ථාවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය මොහාන් ද සිල්වා, ඉන්දියානු නවෝත්පාදකයන්ගේ සංගමයේ සභාපති ආචාර්ය ඒ.එස්.රාඕ, ලෝක නව නිපැයුම් බුද්ධිමය දේපළ සංගමයේ මහ ලේකම් එච්.මැන් ලී සහ තරුණ කටයුතු අධ්‍යක්ෂ එරිචා ඉන්සාන් යන විශේෂ ආරාධිතයන් , විද්වතුන් මෙන්ම නව නිර්මාණකරුවන් විශාල පිරිසක් සහභාගී වූහ.







# දකුණු කොරියාවේ විද්‍යා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය හා සහයෝගීතා වැඩසටහනක්




දකුණු කොරියාවේ අග්‍රාමාත්‍ය කාර්යාලයට අයත් විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය මඟින් ප්‍රමාණාත්මක ප්‍රතිපත්ති විශ්ලේෂණ ක්‍රමවේද සහ පර්යේෂණ සංවර්ධන වානිජකරණ යාන්ත්‍රණය පිළිබඳ වූ ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන්, පර්යේෂකයන් සහ විද්‍යා පරිපාලකයන් පුහුණු කිරීමේ වැඩසටහනක් සැලසුම් කර තිබේ. කොරියානු රජයේ පූර්ණ අනුග්‍රහය සහිතව මේ වැඩමුළුව 2018 වසරේ දී පැවැත්වීමට නියමිතය.

කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනයට අයත් කණ්ඩායමක් දැනටමත් ශ්‍රී ලංකාවට පැමිණ ශ්‍රී ලංකාවේ විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම සමඟ මේ වැඩමුළුව සැලසුම් කරමින් සිටී. ඔවුන්ගේ සංචාරය අතරතුර දෙරට අතර අනාගත සහයෝගීතාවයන් පිළිබඳව, ජාතික විද්‍යා පදනම (NSF), කාර්මික තාක්ෂණ ආයතනය (ITI), ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) සහ විද්‍යා තාක්ෂණ සහ නව නිපැයුම් සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය සමඟ එක්ව කටයුතු කිරීමට නියමිතය.

වෂී 2017 ක් වූ දෙසැම්බර් මස 27 වැනිදා බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.